# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**බුද්ධ ධර්මය** කාලය පැය දෙකයි.

නම / අංකය : ............................................................. 8 ශ්‍රේණිය

### I කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 20 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සිදුහත් කුමරු උදැසන ක්‍රීඩාවට යන අතරමගදී ඡන්න ඇමතිගෙන් සතර පෙර නිමිති විමසා දැනගන්නා ලදී. එම අවස්ථා තුළ සිදුහත් කුමරු සතු පිළිබිඹුවන ගුණාංගය වන්නේ,

(i) අල්ප ශබ්දතාව (ii) ආගන්තුක සත්කාරය (iii) නිහතමානී බව (iv) අනතිමානී බව

(02) දෙව්දත් කුමරු සමඟ පැවිදි වූ කුමාරයෙක් නොවන්නේ,

(i) භද්දිය (ii) ආනන්ද (iii) උපාලි (iv) භග්ගව

(03) බුදුරජාණන් වහන්සේගේ සුහදශීලී කතාබහ තුළ දැකිය හැකි සඛිල යන ගුණාංගයෙන් අදහස් වන්නේ,

(i) කණට සුව එළවන කතාබහය (ii) විවෘත කතාබහය
(iii) සතුටු සාමීචියේ කතාබහය (iv) තමා පළමුව කතාබහ කිරීමය.

(04) ධම්ම රත්නයේ ගුණ ගණන කොපමණද?
(i) 09 (ii) 07 (iii) 06 (iv) 12

(05) බුදුරජාණන් වහන්සේ නන්ද කුමරු පැවිදි කරගනු ලැබුවේ,

(i) නිග්‍රෝධාරාමයේ වැඩ සිටියදී (ii) වේළුවනාරාමයේ වැඩසිටිදී
(iii) ජේතවනාරාමයේ වැඩසිටියදී (iv) පූර්වාරාමයේ වැඩසිටියදී

(06) ධර්මය අනුගමනය කරන්නාට එහි ප්‍රතිඵල මෙලොවදීම දැන දැක ගැනීමට හැකි බැවින් ධර්මය,

(i) අකාලිකය. (ii) ඕපනයික (iii) සන්දිට්ඨිකය (iv) ඒහි පස්සිකය

(07) අත්පොත් තැබීම යනුවෙන් හැඳින් වූ සිරිත වන්නේ,
(i) විවාහ ලියාපදිංචියයි. (ii) අකුරු කියවීමයි.
(iii) සරණ මංගල්‍යයයි (iv) පිරිත් පිංකමයි.

(08) අවමංගල චාරිත්‍රය තිබෙන නිවෙසක රාත්‍රීකාලයේ අනුගමනය කළ පැරණි චාරිත්‍රයකි,
(i) සතිපට්ඨාන සූත්‍රය කියවීම.
(ii) විනෝද ක්‍රීඩා කිරීම.
(iii) වෙස්සන්තර ජාතකය හෝ සතිපට්ඨාන සූත්‍රය කියවීම.
(iv) විනෝද ක්‍රීඩා කිරීම හෝ වෙස්සන්තර ජාතකය කියවීම.

(09) මනාලයා විසින් මනාලියගේ මෑණියන්ට පෝරුව මතදි ලබා දෙන තෑග්ග,
(i) කිරිකඩ හේල (ii) මතක වස්ත්‍ර (iii) රන් ආභරණ (iv) කිසියම් මුදලක්

(10) සීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් ලොව දෙව් මිනිසුන් අතර අග්‍රවන්නේ,

(i) තිලෝගුරු බුදුරදුන් (ii) සැරියුත් හිමියන් (iii) මුගලන් හිමියන් (iv) ආනන්ද හිමියන්

(11) සොරමුලකට හසුවී මහමග මරණයට පත්වූව ද තෙරුවන් ගුණ සිහිකළ නිසා දෙව්ලොව ඉපදුනේ,

(i) පොක්ඛරසාති (ii) ධම්මානුස්සතිය (iii) චින්තානුස්සතිය (iv) බුද්ධානුස්සතිය

(12) සමථ භාවනාවට අයත් "දස අනුස්සති" අතර පළමුව දැක්වෙන අනුස්සතිය වන්නේ,

(i) සංඝානුස්සතිය (ii) ධම්මානුස්සතිය (iii) චින්තානුස්සතිය (iv) බුද්ධානුස්සතිය

(13) රජගහ නුවර "ගිරග්ගසමජ්ජ" සැණකෙළියේ නිරර්ථක බව වටහා ගත් දෙදෙනා කවුරුන්ද?

(i) තපස්සු හා භල්ලුක (ii) උපතිස්ස හා කෝලිත (iii) භගු හා කිම්බිල (iv) උපාලි හා නන්ද

(14) පිරිත් මණ්ඩපයක පිරිත් පුරණ ස්වාමීන් වහන්සේලා දෙනම වැඩසිටින යුගාසනය පිටුපස තබන පුවක් පැළය සහිත කොටස,

(i) රාජගහය (ii) වලයමය (iii) මල්පැල (iv) වියනය

(15) මහ සඟරුවනට දන්දීමෙන් අනතුරුව සිය දියණිවරු විවාහ කරදුන් සිටුතුමා වන්නේ,

(i) රජගහ නුවර සිටුතුමා (ii) ධනංජය සිටුතුමා (iii) බරණැස් සිටුතුමා (iv) උග්ගහ සිටුතුමා

(16) අඟුරට චම්පා නුවර විසූ මහා ධනවතෙකි,

(i) උග්ගහ සිටුතුමා (ii) ධනංජය සිටුතුමා
(iii) සෝණදණ්ඩ බමුණා (iv) අනේපිඩු සිටුතුමා

(17) පිරිත් පංකමකදි විපත් දුරුකර සම්පත් උදාකරදීමට මෙන්ම දුක්, භය, රෝග නැතිකිරීමට පිරිත් දේශනාවට ආරාධනා කරන ගාථාව වන්නේ,

(i) ඉදං වෝ ඤාතීනං හෝතු......... (ii) නත්ථි මේ සරණං අඤ්ඤං.....
(iii) විපත්ති පටිබාහය........ (iv) බුද්ධෝතිලෝක සරණෝ.....

(18) බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,

(i) ධම්සක් පැවතුම් සූත්‍රය (ii) අනන්ත ලක්ඛන සූත්‍රය
(iii) මහා සීහනාද සූත්‍රය (iv) ආදිත්‍යපර්යාය සූත්‍රය

(19) සෝවාන් තත්ත්වයට පත්වූ පළමු රජතුමා,

(i) සුද්ධෝදන රජතුමා (ii) පුක්කුසාති රජතුමා
(iii) අජාසත් රජතුමා (iv) බිම්බිසාර රජතුමා

(20) වත් පිළිවෙත් පමණක් කරමින් සිට පසුව බණ භාවනාවල යෙදීමෙන් රහත් තත්ත්වයට පත්වූ හිමිනම,

(i) සම්මුඤ්ජනී තෙරණුවෝ (ii) ආනන්ද තෙරණුවෝ
(iii) දේවදත්ත තෙරණුවෝ (iv) චුල්ලපන්ථක තෙරණුවෝ

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01)

I. බුදුගුණ භාවනාවේ ආනිසංස දෙකක් ලියන්න.
II. සසර රැස්කල කුසල් බලයෙන් බුදු සසුනේ අගසව් පදවිය ලැබූ භික්ෂූන් වහන්සේලා නම් කරන්න.
III. බුදු දහමට අනුව "පිරිත" යනු කුමක්ද?
IV. සිවුරු හැරයාමට සිතූ චුල්ලපන්තක හිමියන්ට බුදුරදුන් දුන් උපදේශය කුමක්ද?
V. තස තම නැණ මහින්
දහම දත යුතු මැනවින්
..............................................
.............................................. යන කවිය සම්පූර්ණ කරන්න.

(ලකුණු 4 x 5 = 20)

(02)

I. බුදු සිරිතෙහි සඳහන් ආචාරශීලී ගුණාංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
II. බුද්ධ චරිතයෙන් ආගන්තුක සත්කාරය සිදුවූ බවට නිදසුන් තුනක් ලියන්න. (ලකුණු 03)
III. ආචාරශීලීව කටයුතු කිරීම නිසා ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ලකුණු 05)

(03)

I. ධර්ම රත්නයේ ගුණ සිහිකරමින් වැඩියහැකි භාවනාව කුමක්ද? (ලකුණු 02)
II. පහත දැක්වෙන සිද්ධීන්වලට අදාළ කාලසීමා ලියා දක්වන්න.
- බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වයට පත්වීම. (ලකුණු 01)
- බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම. (ලකුණු 01)
- බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා සිදුකරන ලද කාලය. (ලකුණු 01)

III. දහම් ගුණ තුනක් ලියා එහි සරල අර්ථය ද ලියන්න. (ලකුණු 05)

(04)

I. නිවසේදී ඔබ අනුගමනය කළයුතු හොඳ පුරුදු දෙකක් ලියන්න. (ලකුණු 02)
II. බෞද්ධ නිවෙස්වලදී සිදුකරන චාරිත්‍රමය අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)
III. ඉන් එකක් පිළිබඳ පැහැදිළි කරන්න (ලකුණු 05)

(05)

I. මානෙල් සුවඳමය
කුඩමසු පිළී ගඳමය ................. යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
II. මෙම පද්‍ය ලියන ලද්දේ කුමන භික්ෂූන් වහන්සේ විසින්ද? (ලකුණු 03)
III. මෙම කවියේ අදහස තුළින් ගම්‍යවන යහපත් ගුණාංගය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(06)

I. දිසාපාමොක් ඇදුරිඳුගේ වැරදි අවබෝධයෙන් දඬුවම් ලත් දරුණු මිනීමරුවෙකු වූ ශිෂ්‍යයා කවුරුන්ද? (ලකුණු 02)
II. එම ශිෂ්‍යයාට බුදුරදුන් පිහිටවූයේ කුමන අවස්ථාවේදී ද? (ලකුණු 03)
III. එම ශිෂ්‍යයාගේ කථාව ඇසුරින් දම් සභාවේදී බුදුරදුන් විසින් දේශනාකල ගාථාව කුමක්ද? (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

I. නිහතමානී බව
II. බුදුගුණ භාවනාව
III. දේවදත්ත තෙරුන්
IV. කාන්තාවන්ට පැවිද්ද ලබාදීම.
V. සැරියුත් හිමියන්

(එක් මාතෘකාවකට ලකුණු 5 x 2 = 10)